ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

පුරප්පාඩු තනතුර - තාක්ෂණ නිලධාරී (පුරප්පාඩු 02)

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයන් හය (6) කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

(ආ) විද්‍ය/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් 03කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එක්වර සමත් වී තිබීම.

වෘත්තීය සුදුසුකම්

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩ් ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතීත් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

වයස

අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

වැටුප් කාණ්ඩය සහ වැටුප් පරිමාණය

වැටුප් කේත අංකය : MN-3-2016

මාසික වැටුප් පරිමාණය : රු.31,040 - 10 X 445 - 11 X 660 - 10 X 730 - 10 X 750 - 57,550/-

රැකියා විස්තරය

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරන කාර්යයන් සිදු කිරීම මෙම තනතුරට අදාළ වේ.

බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත විභාගයකින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ.

තනතුරෙහි ස්වභාවය

තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

පොදු කොන්දේසි

- ශ්‍රී ලංකාවේ පොදු පුරවැසියෙක් විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය

අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග පහත ආකෘතිය අනුව සැකසූ අයදුම්පත්‍ර 2021. 07.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, 12 වන මහල, බටහිර කුලුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- රජයේ දෙපාර්තමේන්තු සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.
- මේ සම්බන්ධයෙන් කුමන ආකාරයෙන් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

ලේකම්,

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,

---

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

තාක්ෂණ නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම

ආදර්ශ අයදුම් පත්‍රය

01. සම්පූර්ණ නම :
02. ජාතික හැඳුනුම්පත් අංකය :
03. ස්ථිර ලිපිනය :
04. දුරකථන අංකය :
05. උපන් දිනය

    අවුරුද්ද : මාසය : දිනය :
06. i. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :

    ii. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
07. ස්ත්‍රී / පුරුෂ භාවය :
08. විවාහක / අවිවාහක බව :
09. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස

    අවුරුදු : මාස : දින :
10. අධ්‍යාපන සුදුසුකම් :

විභාග/ ඩිප්ලෝමාව/ උපාධිය(සාමාන්‍ය/ ගෞරව)	වර්ෂය	පෙනී සිටි විෂයන්	ලබා ඇති සාමාර්ථයන්	ආයතනයේ විශ්වවිද්‍යාලයේ නම	භාෂා මාධ්‍යය

(සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

11. වෘත්තීය සුදුසුකම් :

විභාග/ ඩිප්ලෝමාව	වර්ෂය	පෙනී සිටි විෂයන්	ලබා ඇති සාමාර්ථයන්	ආයතනයේ විශ්වවිද්‍යාලයේ නම	භාෂා මාධ්‍යය

(සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

12. සේවා පළපුරුද්ද :

සේවය	දරන ලද තනතුර	කාලය		ආයතනය
		සිට	දක්වා	

13. වෙනත් සුදුසුකම් :

.....

.....

.....

.....

අයදුම්කරුගේ / අයදුම්කාරියගේ සහතිකය :

..... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමභාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා හෝ නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙලි වුවහොත් මා නුසුදුස්සෙක් කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා තනතුරින් ඉවත් කිරීමට හැකි බවත් දන්වමි.

....

දිනය අයදුම්කරු/කාරියගේ අත්සන

රජයේ සේවකයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

..... මහතා/ මහත්මිය/ මෙනවියගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ .....

ස්ථිර/ තාවකාලික/ අනියම්/ සේවකයෙකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

....

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව